3 වන පිටෙන්

අපරාධකරුවන්, උම්මත්තකයන්, මෝඩයන් වැනි අය ක්‍රම විරෝධී වීරයන් ලෙස සැලකීමේ ප්‍රවණතාවක් ඈත අතීතයේ සිට ම ලංකාවේ තිබේ. එයට හේතුව ලෙස මට නම් පෙනෙන්නේ ලංකාවේ සමාජය තුළ නවීනත්වයට එරෙහි මානසික කැරැල්ලක් පැවතීම විය හැකි ය.

සාමාන්‍ය මංකොල්ලකරුවෙකුට වඩා විශේෂ පුද්ගලයකු බවට කිසිදු සාක්කියක් නැති සරදියෙල් වීරයකු කරගෙන ඇත්තේ ඒ කාලයේ කවුරුන් හෝ සුද්දකු ඔහු රොබින් හුඩ් පුරාවෘත්තයට සමාන කිරීම නිසා ය.

රොබින් හුඩ් යනුවෙන් පුද්ගලයෙකු ඇත්තට ම සිටි බවට සාධක ඉතා විරල ය. මෙම ඉතිහාස සටහන කියවන්න. නැතිනම් වීඩියෝව බලන්න.

සරදියෙල් අධිරාජ්‍ය විරෝධියකු හෝ දුප්පතුන්ට ධනය බෙදා දුන් අයකු කළ හැක්කේ සාහිත්‍යයකින් පමණි. එහෙත් සාහිත්‍යය ඉතිහාසයක් ලෙස ළමයින්ට ඉගැන්වීමෙන් අප අනාගත පරම්පරාවන්ට ලබා දෙන්නේ ඉතා වැරදි පූර්වාදර්ශයකි.



මරු සිරා

මරු සිරා සම්බන්ධයෙන් ද කිව හැක්කේ මෙය ම ය. මරු සිරා අපරාධකරුවකු කළේ සමාජය විසින් ය යන සමාජ සත්තා යථාර්ථවාදී කලාකරුවන්ගේ සමාජවාදී අදහස වෙනත් ඕනෑම අපරාධකරුවෙකුට ද අදාළ කළ හැකි ය. මරු සිරා පුරාවෘත්තයක් වීම වෙනම කාරණයකි. එහෙත් ඔහු වීරයෙකු නො වේ.

1989 කැරැල්ල සමයේදී සමාජය විසින් අපරාධකරුවන් කරන ලද මෙවැනි වීරයෝ ඇතැමෙකුට ජවිපෙ කොක්ක ගැසුවේ ය. මාල කැඩීම සම්බන්ධයෙන් සිරගතව සිටි පුද්ගලයකුට ඒ කාලයේ කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටි ටිල්වින්ලා කොක්ක ගසා තිබිණි. මෙම පුද්ගලයා පසුව ජවිපෙ සමග එක් වී ප්‍රධාන නගරයක මැද්දේ නිර්භයව පෝස්ටර් ඇලවීම වැනි කටයුතු කළේ ය. පසු කලෙක අසන්නට ලැබුණු පරිදි ඔහු ජවිපෙ නමින් සොරකම්වල යෙදී තිබිණි. මෙවැනි ඇතැමෙකු අවසන් ගමන් ගියේ ජවිපෙ අතින් ම ය.

මිනිසුන් අපරාධකරුවන් වන්නේ සමාජයේ වරදින් ම නො වේ. එයට බලපාන වෙනත් මානසික හේතු රැසක් තිබේ. මෝඩකම හා හිතුවක්කාරකම ඒ අතරින් ප්‍රමුඛ ය.

## ප්ලාස්ටික් හාල් හදන හැටි...



මේ දවස්වල ලංකාවේ ප්ලාස්ටික් හාල් භීතිකාවක් පැතිරෙමින් පවතී. මේ කතාව පසුගිය වසර දෙක තුන ඇතුළත බත් ප්‍රධාන ආහාරය වූ ආසියාවේ හා අප්‍රිකාවේ වෙනත් ඇතැම් රටවලද වරින් වර නැගලා ගිය කතාවකි. උඩුකය නිරුවත් වියට්නාම් තරුණයෙකු කිසියම් යන්ත්‍රයකට ප්ලාස්ටික් කැබලි කපා දමමින් ලප්ලාස්ටික් හාල්ල නිපදවන ආකාරය පෙන්වන යූටියුබ් වීඩියෝවක්ද මේ ආකාරයෙන් සංසරණය වේ.

මගේ අදහස පරිදි, මේ වීඩියෝවේ පෙන්වන යන්ත්‍රය ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කරන යන්ත්‍රයක් විය යුතුය. ප්ලාස්ටික් වලින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය කිරීමට පෙර මුලින්ම කරන්නේ මෙහි ප්ලාස්ටික් හාල් මෙන් පෙනෙන කුඩා ප්ලාස්ටික් පෙලට්ස් හැදීමයි. පසුව අවශ්‍ය පරිදි වර්ණ ගැන්වීමෙන් පසුව මේ ප්ලාස්ටික් පෙලට්ස් වලින් විවිධ දේ හැදිය හැකිය.

වසර විස්සකටත් පෙර මා සේවය කළ කොහුවල හන්දිය ආසන්නව තිබුණු ආයතනයක යට තට්ටුවේ



ප්ලාස්ටික් පෙලට්ස්

තිබුණේ මේ ආකාරයේ ප්ලාස්ටික් පෙලට්ස් ආනයනය කර විකුණන ආයතනයකි. එහි ගබඩා කර තිබුණු ප්ලාස්ටික් පෙලට්ස් අසුරා තිබුණේද හාල් ඇසිරීමටද යොදාගන්නා ආකාරයේ ප්ලාස්ටික් බෑග් වලය. මේ ප්ලාස්ටික් පෙලට්ස් බැලූ බැල්මට ප්‍රමාණයෙන්, හැඩයෙන් හා පැහැයෙන් හාල් වලට සමානය.

කිසියම් අයුරකින් වැරදීමකින් පෙනුමෙන් හා හැඩයෙන් සමාන හාල් වර්ගයක් සමග මිශ්‍ර වුව-හොත් මේ ප්ලාස්ටික් පෙලට්ස් හාල් වලින් වෙන් කර හඳුනා ගැනීම අපහසු වන්නට ඉඩ තිබේ. එහෙත්, මේ ප්ලාස්ටික් පෙලට්ස් හාල් සමග පිසින විටක බත් මෙන් ඉදෙන්නට ඉඩක් නැත.

අප අසා ඇති කතාව අනුව, රයිගමයා හා ගම්පොළයා දෙදෙනා බුලත් කොළ ලෙස ගම්මිරිස් කොළද, ගම්මිරිස් ලෙස පැපොල් ඇටද විකුණන්නට උත්සාහ කළේය. මිරිස් කුඩු වලට ගඩොල් කුඩු කලවම් කරන වෙළෙන්දන් ගැනද අප කුඩා කාලයේ අසා තිබුණේය. මේ සියල්ලක්ම විය හැකි දේවල් වන්නේ යොදා ගන්නා ආදේශකය මිල අඩු එකක් බැවිනි. එහෙත්, ප්ලාස්ටික් පෙලට්ස් සාමාන්‍යයෙන් හාල් මෙන් දෙගුණයක් පමණ මිලෙන් වැඩිය. ඒ නිසා, හාල් සමග ප්ලාස්ටික් පෙලට්ස් හිතාමතාම මිශ්‍ර කර වෙළෙන්දෙකුට ලාබ ලැබිය නොහැකිය.

econmatta.blogspot.com.au

## Cartoon by PK

